# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2065/34 - 2018 අප්‍රේල් මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2018.04.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය : IR/22/02/2014*

### කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික අරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2016.10.11 දිනැති හා අංක 1988/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2016.10.06 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් දඹදෙණිය, වැත්තෑව, වැත්තෑව පාසල ඉදිරිපිට පදිංචි ඩී. එස්. එම්. විජේසිංහ මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් මහනුවර, යටිනුවර වීදිය, අංක 106හි පිහිටි කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.12.19 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 මාර්තු මස 26 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

කොළඹ කාර්මික අධිකරණයේ දී ය

ඩී. එස්. එම්. විජේසිංහ,
වැත්තෑව පාසල ඉදිරිපිට,
වැත්තෑව,
දඹදෙණිය.

*ඉල්ලුම්කරු*

නඩු අංකය : ඒ 3671 *එදිරිව*

කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී,
අංක 106,
යටිනුවර වීදිය,
මහනුවර.

*වගඋත්තරකරු*

අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධවයි

**තීන්දුව හා ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ගරු අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මැතිතුමාගේ අංක IR/22/02/2014 සහ 2016.10.06 දිනැති ලිපිය මගින් එකී ගරු අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා වෙත 1957 අංක 14 හා 1957 අංක 62 හා


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල අනුව ඉහත නම් සඳහන් පාර්ශවයන් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පහත නම් සඳහන් මා පත් කර ඇත.

2. එකී ආරවුල සම්බන්ධයෙන් වූ කම්කරු කොමසාරිස්ගේ අංක IR/22/02/2014 හා 2016.08.19 දින දරන ලිපිය මගින් ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ ''කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි සේවය කළ ඩී. එස්. එම්. විජේසිංහ නැමැති සේවක මහතාට 2012.04.01 දින සිට 2013.03.31 දින දක්වා සහ 2013.04.01 දින සිට 2014.03.31 දින දක්වා කාලයන්ට අදාල වාර්ෂික වැටුප් වර්ධක ප්‍රසාද දීමනා හා ලාබ කොටස් තමාට ලබා නොදීමෙන් අසාධාරණයක් වූ බවට ඔහු විසින් කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත වන්නේද යන්න සහ එලෙස යුක්ති සහගත වන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ'' යනුවෙන් දක්වා ඇත.

3. මෙහිදී ඉල්ලුම්කාර පාර්ශවය සහ වගඋත්තරකාර පාර්ශ්වය තම පළමු හා දෙවන ප්‍රකාශ ගොනු කිරීමෙන් පසු මෙම ආරවුල් සම්බන්ධයෙන් සමථයක් ඇති කිරීමට බේරුම්කරනය විසින් උත්සහ කළ බැවින් ඒ අනුව 2017.03.16 දතමින් ඉල්ලුම්කරුගේ සමථ යෝජනා ඉදිරිපත් කළ අතර වගඋත්තරකාර පාර්ශවයේ 2017.03.23 දින දරන ලිපිය මගින් ඉල්ලුම්කාර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති එකී 2017.03.16 දින දරන සමථ යෝජනා කිසිසේත් පිළිගත නොහැකි බවට වගඋත්තරකාර පාර්ශ්වය දක්වා ඇත.

4. මේ අතර බේරුම්කරණය විසින් මෙම නඩුව විභාගය සඳහා 2017.04.24 වැනි දින යොදාගෙන තිබූ අතර එකී දිනය බේරුම්කරුගේ උපදෙස් අනුව කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරීගේ 2017.04.06 වන දින දරන ලිපිය මගින් 2017.04.24 වන දින අවලංගු කර 2017.05.05 වන දිනට නඩුව කල් දමා ඇත. මේ අතර ඉල්ලුම්කරුගේ 2017.03.30 දින දරන ලිපිය මගින් එකි ඉල්ලුම්කරුගේ නීතිඥ මහතාට මෙම නඩුව සඳහා පෙනී සිටීමට පහසු දින 5ක් ලබා දෙන ලෙස දක්වා ඇති අතර දෙපාර්ශවයේ එකඟතාවය පරිදි නඩුව 2017.06.02 දිනට කල් දමා ඇත. එදිනද පෙනි සිටිම පෙර පරිදි වී ඇති අතර නඩුව ආරම්භ කිරීම කුමන පාර්ශවය විසින් කළ යුතුද යන්න පිළිබඳව තීරණය කිරිම සඳහා මෝසම් පත්‍රයක් ගොනු කරන ලෙස ඉල්ලුම්කරුගේ නීතිඥ මහතා ඉල්ලා සිටි අතර ඒ සඳහා වගඋත්තරකාර පාර්ශවයේ නීතිඥ මහතාගේ එකඟතාවය ලැබුණි. ඒ අනුව එකී මෝසම් පත්‍රයේ පිටපතක් ඉල්ලුම්කාර පාර්ශවයටද දිය යුතු බවට නියෝග කරමින් මීලඟ නඩු විභාග දිනට සති තුනකට පෙර ගොනු කරන ලෙස කාර්මික අධිකරණයේ ලේඛාධිකාරිවරයා වෙත යොමු කරන ලෙසට නියම කරමින් එකී මෝසම් පත්‍රයේ පිටපතක් ඉල්ලුම්කාර පාර්ශවයට ලබා දිය යුතු බවට ද නියෝග කරමින් නඩුව 2017.07.14 දින ප. ව. 2.00 කල් තබන ලදී. මෙදින දෙපාර්ශවයටම සූදානම්ව පැමිණෙන ලෙස නියෝග කර ඇත.

5. එකී 2017.07.14 වන දින නඩුව කැඳවන ලදින් එහිදී ඉල්ලුම්කරු පෙනි සිට ඇති අතර ඔහු වෙනුවෙන් නීතිඥ නිමල් වීරක්කොඩි මහතා පෙනී සිට ඇත. වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් සහකාර සමාන්‍යාධිකාරී මහතා සහ නීතිඥ අජිත් ජයතිලක මහතා සමග නීතිඥ මහින්ද නානායක්කාර මහතා පෙනී සිට ඇත. මෙදින වගඋත්තරකාර පාර්ශවය විසින් 2017.06.23 දතමින් ගොනුකර ඇති මෝසම් පත්‍රය ඉල්ලුම්කාර පාර්ශවයට ලැබී ඇති බව පිළිගෙන ඇත. ඉහත කී මෝසම් පත්‍රයේ කරුණු පිළිගනිමින් බේරුම්කරණය විසින් නඩුව ආරම්භ කරන ලෙසට ඉල්ලුම්කාර පාර්ශවයේ නිතීඥ මහතාට නියම කරන ලදී. ඔහු විසින් කරුණු දක්වමින් තමාට වාචික සාක්ෂි මෙහෙය විය හැකි වුවද දැනටමත් දිවුරුම් ප්‍රකාශයක් ගොනු කිරීමට සූදානම් කර ඇති බැවින් එය ගොනු කිරකීමට අධිකරණයේ අවසරය පතා ඇත. මේ අවස්ථාවේදී වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටින නීතිඥ මහතා කරුණු දක්වමින් ඉල්ලුම්කරුගේ දිවුරුම් පෙත්සම සහ ඒ සමඟ ඉදිරිපත් කරන ලේඛන නිරවද්‍ය ලේඛන ද එකී ලේඛන සේවා යෝජක විසින් නිකුත් නොකරන ලද ලේඛන නම් එකී ලේඛන වල ඡායා පිටපත් පිළිනොගන්නා බවත් එමෙන්ම ඒවායේ සහතික පිටපතක් ඉදිරිපත් කරන්නේ නම් එම ලේඛන ඔප්පු කිරීමේ බාරයට යටත්ව බාර ගන්නා ලෙසත් ඉල්ලා ඇත.

6. එසේම දිවුරුම් පෙත්සම සමඟ ඉල්ලුම්කාර පාර්ශවය වසින් ඉදිරිපත් කරනු ලබන ලේඛන වගඋත්තරකාර පාර්ශවය විසින් නිකුත් නොකරන ලද ලේඛන නම් එකි ලේඛන වල මුල් හෝ එම ලේඛන නිසියාකාරව නිකුත් කරන ලද සහතික පිටපත් විය යුතු බවත් එකී ලේඛන ද ඔප්පු කිරිමේ බාරයට යටත්ව බාර ගන්නා මෙන්ද වගඋත්තරකාර පාර්ශවය ඉල්ලා ඇත. එසේම මෙම දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කිරිමෙන් පසු ඒවා අධ්‍යයනය කිරිමට සාධාරණ කාලයක් ලබා දෙන ලෙස ද ඉන් පසුව හරස් ප්‍රශ්ණ ඇසීමට අවකාශ ලබා දෙන මෙන්ද වගඋත්තරකාර පාර්ශවය විසින් ඉල්ලා ඇත.

7. ඉල්ලුම්කාර පාර්ශවය මේ අවස්ථාවේදී ප්‍රකාශ කර ඇත්තේ ඉල්ලුම්කාර පාර්ශවයෙන් ඉදිරිපත් කරන දිවුරුම් ප්‍රකාශය අද දින සිට සතියක් ඇතුළත ගරු අධිකරණය වෙත ගොනු කරන බවත් එහි පිටපතක් වගඋත්තරකාර ආයතනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යවා ඊට අදාල ලියාපදිංචි තැපැල් භාණ්ඩ කුවිතාන්සි පතද මෙම මෝසම් පත්‍රයට ගොනුකරන බවද ප්‍රකාශ කර ඇත. එකී දිවුරුම් ප්‍රකාශයේ සඳහන් යම් ලේඛනයකට යම් විරෝධතාවයක් ඇත්තේ නම් විභාග දිනයට සති දෙකකට පෙර ඒ පිළිබඳව අධිකරණය වෙත දැනුම් දෙන ලෙස ද එසේ සති දෛකකට පෙර යම් විරෝධතාවයක් ගොනු නොකළේ නම් විරෝධතාවයක් නොමැති බව සලකා එදින විභාග කටයුතු කරන ලෙසද ඉල්ලා ඇත.

8. මේ අවස්ථාවේදී වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් ප්‍රකාශ කර ඇත්තේ එසේ දිවුරුම් ප්‍රකාශය සහ ඊට අදාල ලේඛන වල කොපි වගඋත්තරකාර ආයතනය වෙත එවන අවස්ථාවේදී

වගඋත්තරකාර ආයතනයේ කොළඹ ඇති ලිපිනය වන කොමර්ෂල් ක්‍රෙඩිට් පුද්ගලික සමාගම අංක 45, ධර්මපාල මාවත, කොළඹ 07 යන ලිපිනයට ලැබීමට සලස්වන ලෙසය.

9. මේ අවස්ථාවේදී අධිකරණය විසින් මෙසේ නියෝග කර ඇත.

1. ඉල්ලුම්කරුගේ දිවුරුම් ප්‍රකාශයට අදාල ලේඛන සමග සතියක් ඇතුළත කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරී මහතා වෙත ගොනු කළ යුතු ය.

2. එකී ලේඛන වල පිටපත් දිවුරුම් ප්‍රකාශයේ පිටපත් ලියාපදිංචි තැපෑලෙන් ඊට පෙර වගඋත්තරකාර පාර්ශවය වෙත තමුන් ඉදිරිපත් කරනු ලබන දිවුරුම් පෙත්සමේ සහ ලේඛන වල ඡායා පිටපත් වගඋත්තරකාර පාර්ශවයට ලැබිය යුතු ය.

3. ඉදිරිපත් කරනු ලබන ලේඛන සම්බන්ධයෙන් විරෝධතාවයක් ඇත්නම් එකී විරෝධතාවය ලිඛිතව ලැබී සති තුනක් ඇතුළත ගරු අධිකරණයට යොමු කළ යුතු ය.

මේ අනුව කටයුතු කරන ලෙසට දෙපාර්ශවයට දැනුම් දෙමින් මීලග දිනයේ දී දිවුරුම් ප්‍රකාශය සම්බන්ධයෙන් හරස් ප්‍රශ්ණ ඇසීමට නියම කරමින් 2017.08.21 වන දින පස්වරු 2.00ට කල් දමා ඇත.

10. නියමිත පරිදි 2017.08.21 වන දින නඩුව කැඳවා ඇති අතර එහිදී පෙනී සිටිම පෙර පරිදිම වී ඇත.

මෙහිදි වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා ප්‍රකාශ කර ඇත්තේ ඉල්ලුම්කරුගේ 2017.07.19 වන දින දරන උද්දේශිත දිවුරුම් ප්‍රකාශය වගඋත්තරකාර ආයතනයට ලැබී ඇති නමුත් එය මෙම කරුණට අදාලව ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයක් නොවන බවත් ය. එයට හේතුව වන්නේ මෙම දිවුරුම් ප්‍රකාශයේ ආරම්භයේදීම දිවුරුම් ප්‍රකාශක වන දෙන් සුනිල් මර්වින් විජේසිංහ විසින් සඳහන් කිරීමට යෙදී ඇත්තේ උක්ත නම් සඳහන් දිවුරුම් ප්‍රකාශක හා මෙම නඩුවේ පෙත්කම්කරු මම වෙමි යනුවෙනි. මේ අවස්ථාවේදී ප්‍රකාශ කර ඇත්තේ එම කොටස සම්පූර්ණයෙන් වැරදි සහගත බවයි. එයට හේතුව වන්නේ මෙම නඩුවේ පෙත්සම්කරුවකු නොමැති බැවිනි. ඒ අනුව මෙහිදී වගඋත්තරකාර ආයතනයට පිළිතුරු සැපයීමට හෝ හරස් ප්‍රශ්ණ ඇසීම සඳහා නිසි පරිදි ඉදිරිපත් කරන ලද නීතිය හමුවේ පිළිගත හැකි කරුණු දිවුරුම් ප්‍රකාශයෙන් අඩංගු නොවන බවත් ඒ අනුව එකී උද්දේශිත දිවුරුම් පෙත්සම මුල් අවස්ථාවේදී විරුද්ධත්වය ප්‍රකාශ කරන බවත් ඒ අනුව මෙම උද්දේශිත දිවුරුම් ප්‍රකාශය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන ලෙස මේ අවස්ථාවේ වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් ඉල්ලා ඇත. මේ අවස්ථාවේදී ඉල්ලුම්කාර පාර්ශ්වය කරුණු දක්වමින් ස්වාමිනි බැලූ බැල්මට මෙහි ඉල්ලුම්කරු යන්න වෙනුවට පෙත්සම්කරු ලෙස සඳහන් කර ඇත. එය බැලූ බැල්මට මෙම නඩුවේ ඉල්ලුම්කරුගේ තත්ත්වය දිවුරුම් ප්‍රකාශය මගින් පිළිඹිබු නොවන සේ පෙනෙන බවත් එහෙත් මෙම නඩුවේ ඉල්ලුම්කරු වශයෙන් ඩී. එස්. එම්. විජේසිංහ යන අය මෙම දිවුරුම් ප්‍රකාශයේ පෙත්සම්කරු යනුවෙන් සඳහන් වී ඇති කරුණ මත දිවුරුම් ප්‍රකාශය ප්‍රතික්ෂේප කළයුතු යැයි තමන් කියා නොසිටින බවත් තමන්ගේ උගත් මිත්‍රයාගේ තර්කය හමුවේ ඉල්ලුම්කරු පිළිබඳ හැඳින්වීමේදී පෙත්සම්කරු යනුවෙන් හැඳින්වීම මතම මෙම දිවුරුම් ප්‍රකාශය දොෂ සහගත යැයි කීම උචිත නොවන බවත් ය. එසේම එකී දිවුරුම් ප්‍රකාශයේ සඳහන් පෙත්සම්කරු වෙනුවට ඉල්ලුම්කරු යන්න ආදේශ කර නඩුව ඉදිරියට පවත්වාගෙන යන ලෙස ඉල්ලා ඇත. ඊට අමතරව මෙම නඩුවේ හරයාත්මක වශයෙන් ඉදිරිපත් කර ඇති කිසිදු ලේඛනයක් තමන් භාර නොගන්නා බවට අද දක්වාම ඔහු වෙත හෝ ඔහුගේ සේවාදායකයා වෙත හෝ කාර්මික අධිකරණය වෙත කිසිදු දැනුම්දීමක් කර නොමැති බවත් ඇත්තේ මෙම අඩුපාඩුව නම් අධිකරණයේ අභිමතය භාවිතා කොට මෙම වචනය පසුව සංශෝධනය කිරීමට යටත්ව නඩුව විභාගයට ගන්නා ලෙසත් ඉල්ලා ඇත. මෙහිදී වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් ප්‍රකාශ කර ඇත්තේ දිවුරුම් ප්‍රකාශයක් කිසිදු ආකාරයක සංශෝධනය කළ නොහැකි බවය. නඩුව ආරම්භ වීමෙන් අනතුරුව ඉල්ලුම්කරුගේ උගත් නීතිඥ මහතා ඉල්ලා සිටි ආකාරයට නඩුව ආරම්භ වී සාක්ෂි මෙහෙය වීමෙන් අනතුරුව මෙම උද්දේශිත දිවුරුම් ප්‍රකාශය සංශෝධනය කිරිමට හා අවශ්‍ය කොටස් එකතු කිරිමටත් නොහැකි බව පැහැදිලිව 1895 අංක 09 දරන දිවුරුම් ආඥපනත අනුව මනාව පැහැදිලි වන බවත් ඒ අනුව මෙම අවස්ථාවේදී මෙහි පහත පරිදි ආයාචනය කර ඇත.

අ. නඩුව ආරම්භයෙන් අනතුරුව කිසිදු ආකාරයක 2017.07.19 දරන උද්දේශිත දිවුරුම් ප්‍රකාශය කිසිදු ආකාරයක සංශෝධනය කිරීමට කිසිදු ආකාරයක බලයක් කිසිදු පුද්ගලයෙකුට නොමැති බවත්,

ආ. ඒ අනුව නීතිය ඉදිරියේ පිළිගත නොහැකි 2017.07.19 දරන දිවුරුම් ප්‍රකාශය ප්‍රතික්ෂේප කළ යුතු බවත් ය.

11. ඉල්ලුම්කරු වෙනුවෙන් පෙනී සිටින නීතිඥ මහතා විසින් සඳහන් කරන ලද්දේ වගඋත්තරකාර ආයතනය විසින් ඔවුන් විසින් ගොනුකරන ලද ලේඛන පිළිබඳ කිසිදු ආකාරයක කරුණු දැක්වීමක් කර නොමැති බවත් ය.

12. එහෙත් මෙහිදී වගඋත්තරකාර පාර්ශ්වය ප්‍රකාශ කර ඇත්තේ එම උද්දේශිත දිවුරුම් ප්‍රකාශයට අමුණා ඉදිරිපත් කර ඇති ලේඛන පිළිබඳ කිසිදු අදහසක් ප්‍රකාශ කිරිමේ හැකියාවක් එම දිවුරුම් ප්‍රකාශය සාවද්‍ය වීම අනුව වගඋත්තරකරු හට අවශ්‍යතාවක් නොමැති බවය. එයට හේතුව වන්නේ සාවද්‍ය දිවුරුම් ප්‍රකාශයකට පිළිතුරු සැපයීමක් නීතිය හමුවේ බලාපොරොත්තු නොවන බව සඳහන් කරමින් ඒ අනුව මෙම උද්දේශිත දිවුරුම් ප්‍රකාශය මුල් අවස්ථාවේදීම ප්‍රතික්ෂේප කරන ලෙස ඉල්ලා ඇත.

13. මේ අවස්ථාවේදී අධිකරණය විසින් දිවුරුම් ප්‍රකාශයේ ඇති අඩුපාඩුව එනම් වගඋත්තරකාර පාර්ශවය ඉදිරිපත් කරන මූලික විරෝධතාවය සම්බන්ධයෙන් සිය ලිඛිත දේශණ ඉදිරිපත් කළ යුතු බවට නියෝග කරමින් එම ලිඛිත දේශණ ලැබීමෙන් පසු මෙම විරෝධතාවය සම්බන්ධයෙන් නියෝගයක් ලබා දෙන බවත් ප්‍රකාශ කරමින් 2017.09.22 වන දිනට නඩුව කල් දමා ඇත.

14. 2017.09.22 වන දින නඩුව කැඳවා ඇති අතර එහිදී පෙනී සිටිම පෙර පරිදි විය. මේ අවස්ථාවේදී ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් කියා ඇත්තේ මීට පෙර දින එනම් 2017.08.21 වන දින මෙම අධිකරණය රැස්වූ අවස්ථාවේදී සිදුවූ ආකාරය හෝ සිදුවූ දේ එදින කාර්යය සටහන් වල පැහැදිලිව සටහන් වී නොමැති බැවින් බේරුම්කරු විසින් අධිකරණයට පැමිණෙන අවස්ථාවේදී ආසනයේ වාඩි වීමට ද ප්‍රථම ඉල්ලුම්කාර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශය දෝෂ සහිත බව කියා ගනිමින්ම වාඩිවූ බවත් වගඋත්තරකාර පාර්ශවයේ නීතිඥ මහතා තම ස්ථාවරය පැහැදිලි කරන්නට යෙදුන බවත් එසේ පැහැදිලි කිරීමට පමණක් සම්බන්ධ වී ඇති අතර බේරුම්කරු විසින් කරන ලද නිරීක්ෂණය මෙම කාර්යය සටහන් වල සඳහන් වී නොමැති බවත් එකී සටහන් නොවීම තම සේවාදායකයාගේ අයිතිවාසිකම් වලට අගතිදායක බව සඳහන් කරමින් සහ එම කරුණ ද ඇතුළත් කරමින් තම ලිඛිත දේශණ ගොනුකර ඇති බවයි.

15. මේ අවස්ථාවේදී වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් ප්‍රකාශ කර ඇත්තේ ගරු අධිකරණයේ කටයුතු පිළිබඳව හෝ ගරු අධිකරණය විසින් පවත්වාගෙන යනු ලබන ජර්නල් සටහන් වලට වෙනත් කරුණු ඇතුළත් කිරීමට කිසිදු පාර්ශවයකට අයිතියක් නොමැති බවයි. එසේම මෙම බේරුම්කරණය සඳහා යොමුකර ඇති මෙම අයදුම්පත්‍රයෙහි වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් පෙනී සිටින තමුන් හට පැවරී ඇති වගකීම ඉටුකරනු විනා බේරුම්කරණය කෙරෙහි යොමුකර ඇති බේරුම්කරණයට අදාල වාර්තා නිවැරදි කිරීම සඳහා වගඋත්තරකරු වෙනුවෙන් අභිප්‍රායක් නොමැති බවත් කෙසේ නමුත් අදාල ඉල්ලුම්කරු විසින් දිවුරුම් ප්‍රකාශය නිසි පරිදි ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් වගඋත්තරකාර ආයතනය විසින් පෙන්වා දෙන ලද විරෝධතාවය සම්බන්ධයෙන් අද දින ලිඛිත සැලකිරීම් යොමු කරන බවත් එකී ලිඛිත දේශණයේ පිටපතක් ගරු අධිකරණයේ දී ඉල්ලම්කරුගේ නීතිඥ මහතාට ලබාදෙන ලද බවද ප්‍රකාශ කරමින් අද දින ඉල්ලුම්කරු වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන ඡේද දෙකකින් යුක්ත තනි පිටුවක් සහිත ලිඛිත දේශණය ද බාරගත් බව දක්වා ඇත.

16. මේ අවස්ථාවේදී අධිකරණය විසින් ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන කරුණු තරයේ ප්‍රතික්ෂේප කර ඇත. ඒ අනුව තමන් වාඩිවීමට පෙර බේරුම්කරු විසින් ප්‍රකාශයක් නොකළ බැවින් තමන් ඒ අවස්ථාවේදී ප්‍රකාශ කරන ලද්දේ වගඋත්තරකාර පාර්ශවයේ විරෝධතාවය ප්‍රකාශ කිරිමෙන් අනතුරුව බවත් කෙසේ නමුත් තමන්ද වගඋත්තරකාර පාර්ශවය දන්වා සිටින ලද විරෝධතාවය සටහන් කරන ලද බවත් දක්වා ඇත. ඒ අනුව 2017.08.21 වන දින තමන් විසින් නියෝග කරන ලද්දේ දෙපාර්ශවය විසින් සිය ලිඛිත දේශන ඉදිරිපත් කරන ලෙසත් ලිඛිත දේශන ලැබීමෙන් පසු නියෝගයක් ලබා දෙන බවත් ය. එසේම එම අවස්ථාවේදී ඉල්ලුම්කාර පාර්ශවයේ නීතිඥ මහතා කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොකළ බවත් එසේ හෙයින් කාර්යය සටහන් වල දෝෂයක් නොමැති බව වගඋත්තරකාර පාර්ශවය ප්‍රකාශ කරන බව දක්වා ඇත. මේ අවස්ථාවේදී ඉල්ලුම්කාර පාර්ශවය ප්‍රකාශ කර ඇත්තේ තමන් කරන ලද නිවැරදි කිරීම සම්බන්ධයෙන් තම ස්ථාවරය එසේම බවත් ය. එසේම වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් ප්‍රති ලිඛිත දේශන ලබා දීමට ප්‍රමාණවත් කාලයක් ලබා දීමට ඉල්ලා ඇති අතර ඉල්ලුම්කාර පාර්ශවයේ නීතිඥ මහතා ප්‍රති ලිඛිත දේශන අවශ්‍ය නොවන බව ප්‍රකාශ කර ඇත.

17. කෙසේ නමුදු තම ප්‍රති ලිඛිත දේශන සමඟ අදාල නඩු තීන්දු වල පිටපත් ද ගොනු කරන බව වගඋත්තරකාර පාර්ශවයේ නීතිඥ මහතා ප්‍රකාශ කර ඇති අතර ඉල්ලුම්කාර පාර්ශවයේ නීතිඥ මහතා කිසිදු නඩු තීන්දුවක් අමුණා නොමැති බව ප්‍රකාශ කර ඇත. ඒ අනුව අධිකරණය විසින් ප්‍රති ලිඛිත දේශන ලබාදීම සඳහා 2017.10.12 පස්වරු 2.30ට නඩුව කල් දමා ඇත.

18. නියමිත පරිදි මෙම නඩුව 2017.10.12 දිනට කැඳවන ලදුව නඩුව සඳහා පෙනී සිටිම පෙර පරිදි සිදුවී ඇත. මෙදින නඩුවේ පියවර වී ඇත්තේ වගඋත්තරකාර පාර්ශ්වය ප්‍රතිලිඛිත දේශන ගොනු කිරීමය. ඒ අනුව එකී ප්‍රති ලිඛිත දේශන සූදනම් බව වගඋත්තරකාර පාර්ශවය ප්‍රකාශ කරමින් ලිඛිත දේශණ සමග ඒ1 ලෙස ලකුණු කර ඇති ලේඛනයද ඊට අදාල නඩු තීන්දු දෙකෙහිද සත්‍ය පිටපත් ඉදිරිපත් කරන බව ප්‍රකාර කර ඇත.

19. මේ අවස්ථාවේදී ඉල්ලුම්කාර පාර්ශවයේ නීතිඥ මහතා මෙසේ ප්‍රකාශ කර ඇත. මෙම අවස්ථාවේදී කම්කරු කොමසාරිස් ජනරාල් එම්. ඩී. සී. අමරතුංග මහත්මියගේ අත්සනින් යුතුව 2016.08.19 වැනි දින දරන ලිපිනය කෙරෙහි අවධානය යොමුකර සිටිමි. ඇමතිතුමා විසින් එකී දැන්වීම් ප්‍රකාරව පාර්ශවයන් දෙක හඳුනා ඇත්තේ ඉහත සඳහන් පාර්ශවයන් දෙක අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු යනුවෙන් ය. මෙහිදී නීතිය විසින් ලංකාවේ ව්‍යවස්ථාපිත ආයතන වල 131 වන අධිකාරය වන කාර්මික ආරවුල් පනතේ 1956 ප්‍රතිශෝධන මුද්‍රණය යටතේ සඳහන්ව ඇති දැන්වීමේ මෙම පාර්ශවයන් දෙක හඳුන්වා ඇත්තේ පාර්ශවයන් යනුවෙනි. ඔහු ඉල්ලුම්කරුවෙකු ද, වගඋත්තරකරුවෙකු ද, පෙත්සම්කරුවෙකු ද යන්න හඳුන්වා නැත. එම කරුණ මේ අවස්ථාවේදී ඔබතුමාගේ අවධානය ගෞරවයෙන් පෙන්වා සිටි.

20. ඒ සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය මෙසේ ප්‍රකාශ කර ඇත.

ඉල්ලුම්කරු විසින්ම ඔහු විසින්ම ඉදිරිපත් කරන ලද පැමිණිල්ල ප්‍රකාරව ඔහු විසින්ම ඉල්ලුම්කරු බව හඳුනාගෙන ඇති අතර මා පෙනී සිටින කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමාගම වගඋත්තරකරු ලෙස හදුනාගෙන ඇති අතර මා පෙනී සිටින කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ආයතනය සේවා යෝජක ලෙස හඳුන්වා ඇත. ඊට පසුව පාර්ශවයන් විසින් ගොනුකරන ලද ලේඛන ප්‍රකාරව විශේෂයෙන්ම 2017.03.20 වැනි දින දරන ලේඛනයෙන් ද ඉල්ලුම්කරු සහ වගඋත්තරකරු ලෙස හඳුන්වා දී ඇති අතර 2017.03.16 වන දින දරන ලේඛනය ප්‍රකාරව ඉල්ලුම්කාර පාර්ශවයේ නීතිඥ මහතාගේ අත්සනින් යුතුව ඉදිරිපත් කර ඇති ලේඛනයද සඳහන් වන්නේ ඉල්ලුම්කරුවන් ලෙසය. එමෙන්ම 2016.11.24 වැනි දින ඒ ආකාරයෙන්ම ඉල්ලම්කරු සහ සේවායෝජක වග උත්තරකරු ලෙස දක්වා ඇති බව මේ අවස්ථාවේ සඳහන් කර ඇත. ඒ අනුව මෙහි පාර්ශවයන් දෙක වන්නේ හුදෙක් ඉල්ලුම්කරු සහ වගඋත්තරකරු බවද ඔවුන්ව පෙත්සම්කරු හා වගඋත්තරකරු ලෙස හඳුනා ගැනීමට හැකි බව

ද ප්‍රකාශ කර ඇත. එමෙන්ම පසුගිය දින එනම් 2017.09.22 වැනි දින කාර්ය සටහන් වල සඳහන්ව ඇත්තේ ඉල්ලුම්කාර සහ වගඋත්තරකාර පාර්ශවයන් ලෙසිනි. ඒ අනුව එකී පාර්ශවයන් වඩාත් පැහැදිලිව හඳුනාගත හැක්කේ ඉල්ලුම්කාර පාර්ශ්වය සහ වගඋත්තරකාර පාර්ශවය යන්න ප්‍රකාශ කර ඇත.

21. මේ අවස්ථාවේදී අධිකරණය විසින් දෙපාර්ශවයේ අදහස් සම්බන්ධයෙන් අවධානය යොමුකර ඇති බවත් කෙසේ වෙතත් වගඋත්තරකාර පාර්ශවය ඉදිරිපත් කරන ලද ප්‍රති ලිඛිත දේශණයට පිළිතුරු යථා කාලයේ දී ලබාදීමට කටයුතු කරන බවත් එකී නියෝගය ලේඛාධිකාරී වෙත බාරදීමට කටයුතු කරන බවත් දන්වා ඇත.

22. ඉල්ලුම්කාර පාර්ශවයේ නීතිඥ මහතා මෙසේ ප්‍රකාර කර ඇත.

මා ඉතා ගෞරවයෙන් සඳහන් කරන්නේ මෙහිදී ලබාදීමට ඇත්තේ අතුරු නියෝගයක් වන බැවින් මේ සඳහා අවුරුද්දක පමණ කාලයක ගතවුවහොත් ඉල්ලුම්කරුට සිදුවන්නේ ඉතාම විශාල අගතියක් සිදුවන බැවින් මා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ මෙයට සතියක හෝ දින පහක හෝ නියමිත දිනයක් ලබා දෙන ලෙසය.

23. වගඋත්තරකාර පාර්ශවය විසින් මෙසේ ප්‍රකාශ කර ඇත. මේ අවස්ථාවේදී ගෞරවයෙන් කියා සිටින්නේ අධිකරණයකට හෝ බේරුම්කරුවෙකුට කිසිදු නීතිඥ මහත්මයෙකුට බලපෑමක් කළ නොහැකි බවත් බේරුම්කරු හෝ බේරුම්කාර ආයතනයේ අභිමතය පරිදි කැමති දිනයක් ලබාදිය හැකි බවත් බේරුම්කරුට ඇති අයිතියට හබ නොකරන බවත් බේරුම්කාරතුමන්ට කැමති දිනයක් එය ලබාදෙන ලෙසත් ගෞරවයෙන් ප්‍රකාශ කර ඇත.

24. ඉල්ලුම්කාර පාර්ශවයේ නීතිඥ මහතා මෙසේ ප්‍රකාර කර ඇත.

25. මෙම අතුරු නියෝගය දින නියමයක් නොමැතිව ලේඛාකාධිකාරී වෙත බාරදෙන බවට අධිකරණයෙන් කරන නියෝගයට මා එකඟ නොවන බව ප්‍රකාශ කරමි.

26. වගඋත්තරකාර පාර්ශවයේ නීතිඥ මහතා මෙසේ ප්‍රකාශ කර ඇත.

27. කිසිදු නීතිඥ මහත්මයෙකුට හෝ පාර්ශවයකට බේරුම්කරුට ඇති අයිතියට ස්වාධීනත්වයට හබ කළ නොහැකි බවයි. ඒ අනුව බේරුම්කරු විසින් ලබා දෙන තීරණය යම්කිසි දිනයකට හෝ යම්කිසි දිනයකට පෙර ලබා දෙන ලෙස නියෝග කිරීම සාදාචාරාත්මක හෝ නෛතික අයිතියක් නීතිඥවරයෙකුට හෝ පාර්ශවකරුවෙකුට හෝ අයිතියක් නොමැති බවත් බේරුම්කරුට ඇති එම නෛතික අයිතියට ගරු කරමින් බේරුම්කරුට හැකි පහසු ආකාරයට සියලු කරුණු සලකා බලා සාධාරණ යුක්ති සහගත නියෝගයක් ලබාදෙන ලෙසත් එම දිනය ද බේරුම්කරුගේ අභිමතය පරිදි නියම කළ හැකි පරිදි ද අවශ්‍ය නම් එම නියෝගය දීමෙන් අනතුරුව පාර්ශ්වයන්ට ලියාපදිංචි තැපෑලෙන් දන්වා එවීමට හැකියාව ඇති බවද ප්‍රකාශ කර ඇත. තවද මෙම නඩු ගොනුව දැනටමත් පිටු 200කට වඩා සමන්විත වන අතර මෙම නියෝගය මාස දෙකකින් හෝ කෙටි කාලයකින් ලබා දීමට කටයුතු කරන ලෙස බේරුම්කරුට කිසිදු පාර්ශවයක් විසින් කුමන හෝ ආකාරයකට බලකිරීමට නොහැකි බවත් එය යුක්තිය පසිඳලීමේදී ගැටළුවක් පැන නැගීමට හේතුවන බවත වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

28. පිළිතුරු වශයෙන් තම ස්ථාවරය නැවත වරක් පුනරුච්චාරනය කරන බව ඉල්ලුම්කාර පාර්ශවය ප්‍රකාශ කර ඇත.

29. මේ අවස්ථාවේදී අධිකරණය විසින් දෙපාර්ශවයේ සැලකිරීම් වලට අවධානය යොමු කරන බවත් මෙම නඩුවේ අතුරු නියෝගය ලබා දීමට ඇත්තේ දිවුරුම් ප්‍රකාශයක් සම්බන්ධයෙන් බවත් එනම් දිවුරුම් ප්‍රකාශයේ නීත්‍යානුකූලව ඉදිරිපත් කර ඇත්ද නැත් ද යන්න බවත් ඒ සඳහා තමන්ට සෑහෙන කාලායක් අවශ්‍ය බවත් දක්වා ඇත. එසේම නිමල් වීරක්කොඩි මහතාගේ අත්සනින් යුතුව ඉදිරිපත් කර ඇති ලිඛිත දේශණයේ ද ශිර්ෂයේ සඳහන් කර ඇත්තේ ඉල්ලුම්කරු සහ වගඋත්තරකරු වශයෙන් බවද දක්වා ඇත. එහිදීද නීතිඥ නිමල් වීරක්කොඩි මහතා අත්සන් කර ඇත්තේ අභියාචකගේ නීතිඥවරයා වශයෙනි. එය දෝෂ සහිත බවත් දන්වා ඇත. කෙසේ වෙතත් බේරුම්කරුගේ තීන්දුව ලේඛකාධිකාරිට භාරදෙන බවත් පසුව කාර්යාලය විසින් දෙපාර්ශවයට දැන්වීමට කටයුතු කරන බවත් දක්වා ඇත.

30. මේ අනුව බේරුම්කාර මා විසින් තීරණය කලයුතු වන්නේ ඉහත කී දිවුරුම් පෙත්සම නීතිය ඉදිරියේ පිළිගත හැකි දිවුරුම් පෙත්සමක් ද නැද්ද යන්න ය. ඒ අනුව පහත සඳහන් කරුණු මත මෙම ඉල්ලුම්කරු විසින් ගොනුකර ඇති 2017.07.19 දින දරන දිවුරුම් ප්‍රකාශය සහ එකී දිවුරුම් ප්‍රකාශයේ කොටසක් වශයෙන් සලකන ලෙස ඉල්ලා සලකුණු කර ඇති ඒ1 සිට ඒ65 දක්වා ලේඛන සියල්ලද ප්‍රතික්ෂේප කරමි.

31. මා එසේ දිවුරුම් ප්‍රකාශය ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු නම්

1. ඉහත කී දිවුරුම් ප්‍රකාශය ගොනුකර ඇත්තේ කම්කරු කොමසාරිස් කාර්යාලයේ දී යනුවෙන් විනා කොළඹ කාර්මික අධිකරණයේ දී නොවීම මෙම කොළඹ කාර්මික අධිකරණයේ දීය යන නාමයෙන් විනා ඉහත කී දිවුරුම් පෙත්සමේ ඉහතින් දක්වා ඇති පරිදි කම්කරු කොමසාරිස් කාර්යාලයේ දී වශයෙන් සඳහන් වීම.

2. ඉහත කී දිවුරුම් ප්‍රකාශයේ දිනයට පහළින් දක්වා ඇත්තේ මෙසේ ය. දෙන් සුනිල් මර්වින් විජේසිංහ වන මා රෝමානු කතෝලිකයෙකු වශයෙන් දිවුරා ප්‍රකාශ කර සිටින වග නම් යනුවෙනි. එහිදී විධිමත් දිවුරුම් ප්‍රකාශයක ඇතුළත් විය යුතු ''සත්‍ය ලෙසත් අවංක ලෙසත් ගාම්භිරතා පූර්වකවත් '' යන වචන ඇතුළත් නොකර තිබීමෙන් ඉහත කී දිවුරුම් ප්‍රකාශය විධිමත් දිවුරුම් ප්‍රකාශයක් ලෙස මෙම බේරුම්කරණයට පිළිගත හැකි නොවීම.

3. ඉහත කී දිවුරුම් ප්‍රකාශයේ සහතික කරනු ලබන කොටසේ දක්වා ඇත්තේ මෙසේ ය. ''ඉහත ප්‍රකාශයෙන්

කියවා තේරුම් ගැනීමෙන් අනතුරුව දිවුරුම් දී වර්ෂ 2017 ක් වූ ජූලි මස 19 වැනි දන කොළඹ දී අත්සන් තැබුවෙමි '' යන්න ය. එහිදී කියවා තේරුම් ගැනීමෙන් අනතුරුව සත්‍ය බවට පිළිගෙන යනුවෙන් සඳහන් නොවේ. බිසෝ මැණිකා එදිරිව සිරිල් ද අල්විස් සහ තවත් අය 1982 ISLR 368 නඩුවේදී මෙසේ ප්‍රකාශ කර ඇත. affidavit is a written statements used as evidence in court made by somebody who swears that is true P 8, 95, 122 එසේ හෙයින් සත්‍ය බවට පිළිගෙන යන කොටස ඇතුළත් නොවීමෙන් ඉහත සඳහන් දිවුරුම් හා ප්‍රතිඥ ආඥපනතේ 12.3 වගන්තිය අනුව විධිමත් දිවුරුම් ප්‍රකාශයක් ලෙසට මෙම බේරුම්කරණයට පිළිගත නොහැක. (දිවුරුම් ප්‍රකාශ නීතිය නීතිඥ කපිල ගාමිණී ජයසිංහ පිටුව 149) තව ද කුමාරසිරි සහ තවත් අය එදිරිව රාජපක්ෂ 2006 ISLR 359 දිවුරුම් වගන්තියේ නීතියට අනුකූල නොවන ව්‍යාකූල හා වැරදි වචන වලින් යුක්ත වීම සහ අදාල දිවුරුම් ප්‍රකාශයේ සහතික කරන ලද දිනය හා ස්ථානය සඳහන් නොවීම හේතුවෙන් එකී දෝෂයන් දිවුරුම් හා ප්‍රතිඥ ආඥපනතේ 12(3) වන වගන්තිය පැහැදිලිව උල්ලංඝනය කිරීමක් හේතුවෙන් වලංගු දිවුරුම් ප්‍රකාශයක් නොවන බවට තීරණය කර ඇත. (දිවුරුම් ප්‍රකාශ නීතිය නීතිඥ කපිල ගාමිණී ජයසිංහ පිටුව 53)

4. ඊට අතිරේකව පහත සඳහන් කරුණු අනුව ද මෙම දිවුරුම් ප්‍රකාශය පිළිගත හැකි ලේඛනයක් නොවන බවට මෙම බේරුම්කරණය තීරණය කරයි. එයට හේතු වන්නේ ඉහත කී දිවුරුම් පත්‍ර හා ප්‍රතිඥ ආඥපනත අනුව දිවුරුම් ප්‍රකාශයක් සහතික කල යුත්තේ සාම විනිසුරුවරුයෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු විසිනි. එහෙත් ඉහත කී දිවුරුම් ප්‍රකාශය සහතික කර ඇත්තේ මෙම දෙදෙනාගෙන් කවුරු විසින්දැයි හඳුනාගත නොහැක. එහෙත් එය සහතික කර ඇත්තේ දිවුරුම් කොමසාරිස්වරයෙකු ලෙසින් බව එය අත්සන් කර ඇති නීතිඥවරියගේ මුද්‍රාව අනුව පෙනී යයි. එහෙත් පිළිගත් නීතිය අනුව අත්සන් කළ යුත්තේ කවුරුන් විසින්දැයි යන්න පැහැදිලිව දැක්විය යුතු ය. ඊට අතිරේකව ඉහත කී දිවුරුම් පත්‍ර හා ප්‍රතිඥ ආඥපනත අනුකූලව මෙම දිවුරුම් ප්‍රකාශයේ jurat වැකිය දක්වා ඇත්තේ '' ඉහත ප්‍රකාශයන් කියවා තේරුම් ගැනීමෙන් අනතුරුව '' යනුවෙනි. එහෙත් විධිමත් දිවුරුම් ප්‍රකාශයක jurat වැකියේ සඳහන් වන්නේ කියවා තේරුම්කර දීමෙන් පසුව ඒවා සත්‍ය හා නිවැරදි බවට පිළිගෙන ප්‍රතිඥ දී සහතික කර/දිවුරා යනුවෙනි. එහිදි එය සහතික කරන්නා විසින් කියවා තේරුම්කර දිය යුතු ය. මෙයද ඉහත කී දිවුරුම් පත්‍ර හා ප්‍රතිඥ ආඥපනතට අනුකූල නොවන අතර එකී දිවුරුම් ආඥපනත උල්ලංඝනය කිරීමකි.

5. සාමාන්‍යයෙන් දිවුරුම් පත්‍ර ආඥපනත අනුව දිවුරුම් ප්‍රකාශයන් පොතක ආකාරයෙන් එකම කඩදාසියක දෙපැත්තේ සටහන් කළ යුතු බව (RSC Orders 41rl(s) දක්වා ඇති බව දක්වා ඇත.) මෙම දිවුරුම් ප්‍රකාශයේ තනි කොලය වශයෙන් තනි පිටුව වශයෙන් කොළ 3ක ඉදිරිපත් කර ඇත. මේ අනුව ද මෙම දිවුරුම් ප්‍රකාශය පිළිගත හැකි දිවුරුම් ප්‍රකාශයක් ලෙසට මෙම බේරුම්කරණයට පිළිගත නොහැකි වීම. (දිවුරුම් ප්‍රකාශ නීතිය නීතිඥ කපිල ගාමිණී ජයසිංහ පිටුව 49)

6. මෙම දිවුරුම් ප්‍රකාශයෙන් ඉහතින්ම අ ලෙස දක්වා ඇත්තේ උක්ත නම් සඳහන් දිවුරුම් ප්‍රකාශක හා මෙම නඩුවේ පෙත්සම්කරු මම වෙමි යනුවෙනි.

මෙම දිවුරුම් පෙත්සම සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය සිය ලිඛිත දේශනය මගින් ඉදිරිපත් කර ඇති පරිදි මෙම කාර්මික අධිකරණයේ පවත්නා නඩුවල පෙත්සම්කරුවෙකු නොමැති අතර සිටිනුයේ ඉල්ලුම්කරු හා වගඋත්තරකරු යන දෙදෙනා වීම.

මෙම නඩුවේ ඉහත කී දිවුරුම් ප්‍රකාශයේ සිරසේ දක්වා ඇත්තේ එසේ ඉල්ලුම්කරු හා පෙත්සම්කරු යනුවෙන් ය. එහෙත් දිවුරුම් ප්‍රකාශක හා මෙම නඩුවේ පෙත්සම්කරු මම වෙමි යනුවෙන් හැඳින්වීම කිසිසේත් නීතියට අනුකූල නොවේ. එසේ වුවත් මෙම දිවුරුම් ප්‍රකාශයේ දිවුරුම් ප්‍රකාශක ඉල්ලුම්කරු යනුවෙන් දක්වා අත්සන් කර ඇත. ඒ අනුව මෙම නඩුවේ පෙත්සම්කරුවෙකු නොමැති බැවින් සිටිනුයේ ඉල්ලුම්කරුවෙකු පමණක් බැවින් ඒ අනුව ද මෙම දිවුරුම් ප්‍රකාශය ද පිළිගත හැකි දිවුරුම්ප්‍රකාශක් ලෙසට තීරණය කළ නොහැක.

7. මෙහිදි ඉල්ලුම්කාර පාර්ශවයේ නීතිඥවරයා විසින් මෙම නඩුවට සම්බන්ධිත යොමුවෙහි කම්කරු කොමසාරිස් එම්. ඩී. සී. අමරතුංග මහත්මියගේ අංක IR 22/02/2014 සහ 2016.08.19 වැනි දින දරන ලිපියේ සඳහන් වන්නේ ඉහත සඳහන් පාර්ශවයන් අතර පාර්ශවයන් යනුවෙන් දක්වා ඇති බව ගරු බේරුම්කරණයට පෙන්වා දී ඇතත් නඩුවක් ආරම්භ වනුයේ එසේ යොමු කිරීමෙන් පසු බව මෙහිලා බේරුම්කරණය විසින් සැලකිල්ලට ගත් බව පෙන්වා දෙමි. එසේ හෙයින් නඩුවක් ආරම්භ වූ පසු ඉදිරිපත් කරන ලියවිලි නීත්‍යානුකූලව සහ පිළිගත හැකි ආකාරයට ඉදිරිපත් කිරීම අදාල පාර්ශවයන්ගේ යුතුකම හා වගකීම වේ.

32. දිවුරුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ලබාදී ඇති නිර්වචන මෙසේ වේ.

1. Collin's Law Dictionary හි 5 වන මුද්‍රණයේ 1992 නැවත මුද්‍රණයේ දිවුරුම් ප්‍රකාශයක් යනු අධිකරණයේ දී භාවිතා කළ හැකි සොලිසිටර්වරයෙකු ඉදිරිපිට ලිඛිතව සකසා දිවුරුම් දී අත්සන් කළ ප්‍රකාශයක් යනුවෙන් දක්වා ඇත. (Written Statement which is signed and sworn before a solicitor and which can be used as evidence in Court hearing)

2. (Oxford English Dictionary 1982 2nd Edition) Vol. 1 Page 216 හා දිවුරුම් ප්‍රකාශයක් යන්න මෙසේ දක්වා ඇත.

An affidavit is statement made in writting confirmed by the maker's oath and intended to be used as judicial proof.

මෙහි අරුත නම් අධිකරණයේ දී කරුණු තහවුරු කිරීම සඳහා උපයෝගි කර ගත හැකි ලිඛිතව සැකසු එය සැකසූ නැතැත්තාගේ දිවුරුමෙන් ස්ථිර කරනු ලැබූ සත්‍ය ප්‍රකාශයක් දිවුරුම් ප්‍රකාශයක් සේ සැලකිය හැකි බවයි. (දිවුරුම් ප්‍රකාශ නීතිය නීතිඥ කපිල ගාමිණී ජයසිංහ පිටුව 10 සහ 11)

දිවුරුම් ප්‍රකාශ වලට බලපාන ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන වශයෙන් බලපානුයේ 1953 අංක 23 දරන දිවුරුම් ප්‍රකාශ හා 1895 අංක 9 දරන දිවුරුම් හා ප්‍රතිඥ ආඥපනතේ 1989 අංක 2 දරන සිවිල් නඩු විධාන සංග්‍රහ පනත සහ 1979 අංක 15 දරන අපරාධ නඩු සංග්‍රහ පනතේ ඇති ප්‍රතිපාදනත් 2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනත යටතේ පවතින ප්‍රතිපාදනත් 1995 අංක 14 දරන සාක්ෂි විශේෂ විධිවිධාන පනතේ ඇති ප්‍රතිපාදනත් ඉහත පනත් වලට අදාලව ඉහළ අධිකරණයන් විසින් ලබා දී ඇති නඩු තීන්දුත් වේ.

රවී කරුණානායක එදිරිව විමල් වීරවංශ 2006 (3) SLR 16 නඩුවේදී ඇන්ඩෲ සෝමවංශ විනිසුරුතුමා මෙසේ දක්වා ඇත.

Held

3. Section 437 provides that an affidavit must be sworn or affirmed to by the person professing to make the statement embodied in the affidavit before any court justice of the peace or commissioner for oaths.

4. The Law requires that the jurat must mention the fact of an oath being admitted or an affirmation made form 75 of the code and the affidavit could not have been read over)
(දිවුරුම් ප්‍රකාශ නීතිය නීතිඥ කපිල ගාමිණී ජයසිංහ පිටුව 40)

5. වීරමන් එදිරිව සදාවරන් 2002 3 SLR 222 නඩුවේදී මෙසේ ප්‍රකාශ කර ඇත. The affidavit is fatally flawed and should be rejected in limine. Permitting the defendant respondent to amend the affidavit is wrong. (දිවුරුම් ප්‍රකාශ නීතිය නීතිඥ කපිල ගාමිණී ජයසිංහ පිටුව 55 සහ 56) මේ අනුව ද ඉහත කී දිවුරුම් ප්‍රකාශය පිළිගත නොහැකි බවට වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත දේශනය සහ වාචිකව ඉදිරිපත් කිරීම් පිළිගත හැකිවීම.

33. මෙම හේතුන් නිසා ඉහත කී දිවුරුම් ප්‍රකාශය හා එහි කොටසක් ලෙසට පිළිගන්නා ලෙසට දක්වා ඇති ඒ 1 සිට 65 දක්වා වූ ලේඛන ද ප්‍රතික්ෂේප කරමි.

34. ඉහත පරිදි මෙම නියෝගය හේතුවෙන් ඉහත කී දිවුරුම් ප්‍රකාශය මගින් ඉදිරිපත් කර ඇති මූලික සාක්ෂි හා එය අනුබද්ධිත ඒ 1 සිට 65 දක්වා ලේඛන ද ප්‍රතික්ෂේප වන බැවින් මෙම නඩුවේ අතුරු නියෝගය වෙනුවට අවසාන තීන්දුවක් හා ප්‍රදනයක් ප්‍රකාශයට පත් කරමි. ඒ අනුව මෙහිදී ඉල්ලුම්කාර පක්ෂයට ප්‍රදානයක් ලබා නොදීමට තීරණය කරමි.

35. මෙය සාධාරණ යුක්ති සහගත නියෝගයක් හා ප්‍රදානයක් කොට මම සලකමි.

පී. දනන්සූරිය,
බේරුම්කරු.

2017ක් වූ දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

04-706

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.